# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1781/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 30/11/2024 පැය 1140

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.11.29 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කැලණිය පොලිස් වසමේ වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 800 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකරුවෙකු ජංගම දුරකථනයක් හා ත්‍රීරෝද රථයක් සමඟ** අත්අඩංගුවට ගෙන කැලණිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කැලණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.11.29 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මහබාගේ පොලිස් වසමේ වැලිසර ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 33 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන** මහාබාගේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන රාගම ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** මහබාගේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. ගංජා පැල සහ මෙරට නිෂ්පාදිත ගිනි අවි 04 ක් සමඟ සැකකරුවන් 08 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.11.29 වන දින උදෑසන කාලයේ සිට සවස් කාලය දක්වා පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ සහ සියඹලාණ්ඩුව කඳවුරේ නිලධාරීන් හා ඒකාබද්ධව ලුණුගම්වෙහෙර පොලිස් වසමේ ලුණුගම්වෙහෙර රක්ෂිත ප්‍රදේශයේ වැටලීම් 08 ක් සිදු කර වගා කර තිබූ ගංජා පැල **496,700 ක්** හා **මෙරට නිෂ්පාදිත ගිනි අවි 04ක් සමඟ සැකකරුවන් 08 දෙනෙකු අත්අඩංගුවට** ගෙන ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 38,39,41,42,44,45 හා 53, ක් වන තණමල්විල හා සූරියවැව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** ලුණුගම්වෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**